කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2019

අප්‍රේල් - 2023

**BMGT E1045 - ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න **පහකට (05)** කට පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

අ) නීතියේ අරමුණු සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) අභියාචනාධිකරණයේ සංයුතිය සහ අධිකරණ බලතල මොනවාද?

(ලකුණු 08)

ඇ) සිවිල් නීතියේ ශාඛා හතරක් නම් කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) "ගිවිසුම් නීතිය නවීන ව්‍යාපාර ගොඩනැගී ඇති පදනමයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? සුදුසු උදාහරණ සමඟ හේතු දක්වන්න.

(ලකුණු 10)

ආ) අසංක ඔහුගේ මෝටර් රථය රුපියල් මිලියනයකට හේමන්ත වෙත විකිණීම සඳහා අර්පනයක් ඉදිරිපත් කළ අතර එය රුපියල් 950,000 කට මිලදී ගැනීමට හේමන්ත එකඟ විය. එහෙත්

950,000 කට මෝටර් රථය විකිණීම අසංක ප්‍රතික්ෂේප කළේය. පසුව හේමන්ත රුපියල් මිලියනයකට මෝටර් රථය මිලදී ගැනීමට එකඟ විය. නමුත් අසංක මෝටර් රථය විකිණීම ප්‍රතික්ෂේප කළේය. ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් අසංකට එරෙහිව නීතිමය පියවර ගැනීමට හේමන්ත අදහස් කරයි. විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් හේමන්තට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) සහන්ට ඔහුගේ ඔස්ටින් කූපර් මෝටර් රථය විකිණීමට අවශ්‍ය වූ අතර එය පුවත්පතක ප්‍රචාරය කළේය. සොරෙකු වන නාමල් එය මිලදී ගැනීමට පැමිණි අතර, ඔහු සුප්‍රසිද්ධ විජේ කුමාර් යන සුප්‍රසිද්ධ නළුවා බවට සහන්ට ඒත්තු ගැනීමට කටයුතු කළේය. නාමල් සහන්ට ඔහු තමා මිලදී ගත් මෝටර් රථය සඳහා චෙක්පතක් ලබා දුන්නේය. එවිට සහන් නාමල් ලබා දුන් චෙක්පත භාර ගැනීමට අකැමැති වූ නමුත් සහන්ට එය පිළිගන්නා ලෙස සොරා බල කළේය. ඒ නිසා සහන් අදාල තැනැත්තා විජේ කුමාර් බව ඔප්පු කිරීමට යමක් ඇතිදැයි නාමල් විමසූ විට ජාතික චිත්‍රපට නිෂ්පාදනාගාරය නිකුත් කළ විජේ කුමාර් ලෙස අත්සන් කර ඇති හැඳුනුම්පත ඉදිරිපත් කළේය. එවිට සහන් නාමල්ට වාහනය රැගෙන යාමට අවසර දුන්නේය. නාමල්ගේ චෙක්පත සොරකම් කරන ලද චෙක් පොතකින් වූ අතර එය අගරු විය. නාමල් වහා රථය ලක්සිරිට විකුණූ අතර ඉන් අනතුරුව අතුරුදන් විය. සහන් ලක්සිරිට විරුද්ධව මෝටර් රථය ආපසු ලබාගැනීමට නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. සහන්ට සාර්ථක විය හැකිද?

(ලකුණු 10)

ආ) ගිවිසුම් කඩකිරීමකදී, අහිංසක පාර්ශවයකට 'සාමාන්‍ය හානි' සහ 'විශේෂ හානි' ඉල්ලා සිටිය හැක්කේ කුමන තත්ත්වයන් යටතේද? විනිශ්චිත නඩු තීන්දුවලට අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) Ceylon Government Railway (CGR) විසින් ඇමරිකානු අභිජනන මී හරකෙකු කොළඹ සිට යාපනය දක්වා ප්‍රවාහනය කර තිබුණි. බණ්ඩාර නම් කිරි ගොවියා විසින් මෙම සතා CGR වෙත ලබා දී ඇති අතර ඔහු දුම්රිය බලධාරීන්ට උපදෙස් දුන්නේ අදාල සත්වයා බාලචන්ද්‍රන්ට භාර දෙන ලෙසයි. අදාල සත්වයා යාපනේ දුම්රිය ස්ථානය වෙත ලඟා වුවද සතා භාරගැනීමට

කිසිවෙකු පැමිණියේ නැත. එබැවින් දුම්රිය බලධාරීන් විසින් අදාල සත්වයා ආරක්‍ෂක ස්ථානයක් වෙත යොමු කළේය. අදාල දුම්රිය බලධාරීන් විසින් ඒ සඳහා අදාල ගාස්තුව ගෙවන ලදී. මේ අතර බාලචන්ද්‍රන් ගවයා රැගෙන යාමට පැමිණි අතර දුම්රිය බලධාරීන් ගාස්තුව ගෙවන ලෙස ඉල්ලා සිටියේය. එහෙත් එය ගෙවීම බාලචන්ද්‍රන් ප්‍රතික්ෂේප කළේය. බාලචන්ද්‍රන් අදාල ගාස්තුව ගෙවීමට බැඳී සිටිනවාද යන්න විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) "සුවිශේෂී තත්ත්වයන් යටතේ නියෝජිතයෙකුට තම උප නියෝජිතයා ලෙස වෙනත් පුද්ගලයෙකු පත් කර තමා සතු සියලු බලතල උප නියෝජිතයා වෙත පැවරිය හැකිය." නියෝජිතයෙකුට උප නියෝජිතයෙකු පත් කළ හැකි එවැනි අවස්ථා පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) ප්‍රභාත් ගරාජ් හිමියකු වන ජානකගෙන් ලොරියක් මිලට ගත්තේය. ප්‍රභාත් එය මාස හයක් තම ප්‍රවාහන ව්‍යාපාරයට යොදා ගත්තේය. කෙසේ වෙතත් මෙම ලොරිය දැඩි අලුත්වැඩියා කටයුත්තක් සඳහා ජානකගේ ගරාජයට යවා ඇත්තේ පෙරේරා විසිනි. ප්‍රභාත් එම ලොරිය අනුරාධපුරයට ගෙන ගිය අවස්ථාවක පෙරේරා එය හඳුනා ගත්තේය. පෙරේරා විසින් ලොරි රථය සිය භාරයට ගත්තේය. පසුව ප්‍රභාත්ට දැනගන්නට ලැබුණේ ජානකට ලොරි රථයේ හිමිකමක් නොමැති බවත් එහි සැබෑ හිමිකරු පෙරේරාට එය ආපසු ලබාදිය යුතු බවත්ය. ඒ අනුව ප්‍රභාත් ලොරිය මිලදී ගැනීමට ගෙවූ සම්පූර්ණ මුදල අය කර ගැනීම සඳහා ජානකට එරෙහිව නීතිමය පියවර ගත්තේය. ජානකගේ තර්කය වන්නේ ප්‍රභාත් මාස හයක් ලොරිය පාවිච්චි කර ඇති බැවින් ඔහුට සම්පූර්ණ මුදල ගෙවිය යුතු නැති බවයි. විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් අදාළ පාර්ශ්වයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 12)

ආ) 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥාපනත යටතේ දක්වා ඇති භාණ්ඩ වර්ග හතරක් (4) සුදුසු උදාහරණ සමඟ සඳහන් කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

අ) 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සීමිත සමාගමක නම ලියාපදිංචි කිරීම සම්බන්ධ විධිවිධාන මොනවාද?

(ලකුණු 10)

ආ) රක්ෂණයේ මූලික මූලධර්ම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) පහත සඳහන් දැක්වෙන අවස්ථාවල නීත්‍යානුකූලභාවය (නෛතික ශක්‍යතාවය) කෙටියෙන් පැහැදිලි කරන්න.

i. මදුමතී මහත්මිය සිය උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු 2021 අගෝස්තු 01 වැනි දින ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට කනිෂ්ඨ විධායක නිලධාරිනියක ලෙස සම්බන්ධ වූවාය. ඇය 2022 සැප්තැම්බර් මාසයේදී කණිෂ්ක සමඟ විවාහ වීමට බලාපොරොත්තු වේ. විවාහ මංගල්‍යය සඳහා වාර්ෂික නිවාඩු ලබා ගැනීමට ඇය අදහස් කරන අතර ඇයට නිවාඩු දින 10 ක් ලබා ගත හැකි බව විශ්වාස කරයි.

(ලකුණු 05)

ii. අමායා සැලුන් ආයතනය මගින් රිෂානිව කොණ්ඩා මෝස්තර ශිල්පිනියක් ලෙස බඳවා ගන්නා ලදී. රැකියාවට බැඳී මාස තුනකට පසු රිෂානි තමන් මාස 5ක ගැබිණියක් බව එම ආයතනයේ හිමිකාරිය වන චතුරි මහත්මියට දැන්වූවාය. බඳවා ගන්නා අවස්ථාවේදී ගර්භනීභාවය පිළිබඳව තමන්ව දැනුවත් නොකළ බවට තර්ක කරමින් චතුරි මහත්මිය රිෂානි රැකියාවෙන් ඉවත් කිරීමට තීරණය කළාය.

(ලකුණු 05)

ආ) සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල අතර වෙනස්කම් සඳහන් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 08**

ආ) ශ්‍රී ලංකාවේ පවතින විවිධ රැකියා වර්ග සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ). "වැඩ වර්ජනය කම්කරු ප්‍රජාව සතු නීත්‍යානුකූල අවියකි." වැඩ වර්ජනයක් නීති විරෝධී වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් බවට පත්වන්නේ කුමන තත්ත්වයන් යටතේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**